# පුරප්පාඩු දැන්වීමයි
## මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ**
**පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරට බඳවා ගැනීම සඳහා අයැදුම්පත් කැඳවීම**

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඉදිරියේදී පුරප්පාඩු වීමට නියමිත පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා පත්කිරීමට දැනට රාජ්‍ය සේවයෙහි හා පළාත් රාජ්‍ය සේවයෙහි සේවයේ නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ සුදුසුකම්ලත් නිලධාරීන් වෙතින් අයැදුම්පත් කැඳවනු ලැබේ.

**01.** **සුදුසුකම්**

I. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ වසර 05කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය.
II. දැනටමත් රාජ්‍ය/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධරයන් වෙතින් පමණක් අයැදුම්පත් කැඳවන බැවින් වයස් සීමාවක් අදාළ නොවේ.
III. අයැදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුයි.
IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

**02.** **බඳවා ගැනීමේ ක්‍රමය**

මෙම නිවේදනයේ දක්වා තිබෙන සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ අයැදුම්කරුවන් අතුරින්, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සහිතව මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකදී, මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරනු ලැබ ඇති ලකුණු පරිපාටියකට අනුව ලකුණු පිරිනමා, ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයා ඉහත පුරප්පාඩු වීමට නියමිත තනතුර සඳහා බඳවා ගනු ලැබේ.
(අනුමත ලකුණු නිර්ණායක www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙහි ඉදිරියේදී පළ කරනු ඇත.)

**සටහන:** සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්,
ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයැදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

**03.** **අයැදුම්පත් ඉදිරිපත් කිරීම**

- විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයැදුම්පත්, දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මඟින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයැදුම්පත පළාත් අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම් ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතුය) **" ලේකම්, මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 244, කටුගස්තොට පාර, මහනුවර "** යන ලිපිනයට **2024.05.31** වන දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

- අයැදුම්පත බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ **" මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා අයැදුම්පත් කැඳවීම "** යනුවෙන් සඳහන් කළ යුතුය.

- නියමිත දිනට පසු ලැබෙන අයැදුම්පත් , අසම්පූර්ණ අයැදුම්පත් හා අයැදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයගේ අයැදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

- අයැදුම්පත් ප්‍රමාද වීම හෝ නැති වීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව භාර ගනු නොලැබේ.

(ආදර්ශ අයැදුම්පත්‍රයක් www.psc.cp.gov.lk යන වෙබ් අඩවියෙන් බාගත කර ගත හැකිය)

**04.** මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති සියළුම කරුණු පිළිබඳ තීරණ ගැනීමේ බලය මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

**05.** මෙම දැන්වීමේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර, යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේය.

මෙයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කුමුදිනී එස්. ප්‍රේමචන්ද්‍ර,
ලේකම්,
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

2024 මැයි මස 10 වැනි දින.
මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා
කාර්යාලයේදීය